# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 807/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 13/05/2024 පැය 1145

**මාධ්‍ය නිවේදනය**

**අධිකරණ නියෝගයක් දැනුම් දීම.**

2024.05.13 වන අද දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ නාවල විවෘත විශ්ව විද්‍යාලයේ සිසු සිසුවියන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඒකාබද්ධව එම විශ්ව විද්‍යාල දෙක ඉදිරිපිටින් ආරම්භ කරනු ලබන විරෝධතා පා ගමනක් නුගේගොඩ නගර මධ්‍ය දක්වා ගමන් කිරීමට නියමිතව ඇති බවත්, මෙම පා ගමනේදී උද්ඝෝෂකයින් විසින් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් හා වීදි නාට්‍ය රඟදක්වමින් විරෝධතාවයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවට මිරිහාන මුලස්ථාන පොලිස් පරීක්ෂකවරයාට ලද තොරතුරක් මත ඔහු විසින් එය තහනම් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව නුගේගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව ගරු අධිකරණය මඟින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා පහත සඳහන් වග උත්තරකරුවන් වන

1. ඉසුර ඉඳුවර, මහා ශිෂ්‍ය සංගමයේ සභාපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
2. හර්ෂ නිපුන්, මහා ශිෂ්‍ය සංගමයේ ලේකම්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
3. උදාර රණසිංහ, මහා ශිෂ්‍ය සංගමයේ සභාපති, නාවල විවෘත විශ්ව විද්‍යාලය
4. බුවනෙක දීපාල්, මහා ශිෂ්‍ය සංගමයේ ලේකම්, නාවල විවෘත විශ්ව විද්‍යාලය
5. ධම්මික එස්. ප්‍රියන්ත, මංගල දාබරේරා, සම සභාපති විශ්ව විද්‍යාල වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව
6. දයාරත්න, සම සභාපති, අනධ්‍යයන සේවක වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
7. ප්‍රේමරත්න, සම සභාපති, අනධ්‍යයන සේවක වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව, නාවල විවෘත විශ්ව විද්‍යාලය

ඇතුළු සහභාගී වන වෙනත් තැනැත්තන්ට අද දින අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය පැවැත්වෙන අතර අනුලා විද්‍යාලය, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය, ශාන්ත ජෝන් පිරිමි විද්‍යාලය, සුජාතා බාලිකා විද්‍යාලය යන විද්‍යාල වල විභාග මධ්‍යස්ථාන ලෙසද නුගේගොඩ අනුලා විද්‍යාලය විභාග සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ලෙසද ප්‍රධාන මාර්ගය ආසන්නයේ පවත්වාගෙන යනු ලබන හෙයින් ඉදිරිපත් කල කරුණු අනුව අදාල පාසල් වල මෙවර අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට දැඩි බලපෑමක් විය හැකි බැවින් ඉහතින් සඳහන් කල පාසල්

ඉදිරිපිට මාර්ගයේ විරෝධතාවයන් පැවැත්වීම තහනම් කරමින් අධිකරණ ආඥාවක් නිකුත් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**